සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**11 ශ්‍රේණිය** අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019 **44 S I**

## නැටුම් ( දේශීය) - I

**කාලය පැය එකයි**

**සැලකිය යුතුයි :- ● සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න**

01. සරඹ අභ්‍යාස කිරීමේදී සිව්ගුණ වශයෙන් හදුන්වන්නේ .......................................... ලයයි.
   i. විලම්භ. ii. ද්‍රැත. iii. මධ්‍ය. iv. ප්ලූත.

02. ''දිවිකඳුරු ද ගස එතැන තිබෙන්නේ'' මෙම කවි පද කොටස .............................. ගායනයට අයත්වේ
   i. ලී කෙළි කවි. ii. කළගෙඩි කවි. iii. මෝල්ගස් කවි. iv. කුළු කවි.

03. තත්ජිත් තකජිත් තත්ජිත් තොං නං තා. මෙය ................................ කස්තිරම වේ.
   i. දෙවන ගොඩ සරඹයේ . ii. පළමුවන ගොඩ සරඹයේ.
   iii. තුන්වන ගොඩ සරඹයේ. iv. සිව්වන ගොඩ සරඹයේ.

04. සතර අභිනය .................................... වශයෙන් සිව්වැදෑරුම්ය.
   i. වාචික, ආංගික, රස භාව, ආහාර්යය. ii. අංග, ප්‍රත්‍යාංග, විභංග, උපාංග.
   iii. හිස, දෙඇස්, දෙඅත්, දෙපා. iv. වාචික, සාත්වික, ආංගික, ආහාර්ය.

05. ද්‍රවිඩ හා මුස්ලිම් ජනයා අතර වඩාත් ප්‍රචලිත ජන නැටුමකි ..........................................
   i. ලීකෙළි. ii. කළගෙඩි. iii. බුම්මැඩි. iv. වේවැල්.

06. මාත්‍රා 2 + 2 + 4 තිත් රූපය නම් කරනු ලබන්නේ ................................. තුන්තිත ලෙස ය.
   i. දෙසුළු මැදුම්. ii. දෙසුළු මහ. iii. දෙමැදුම් මහ. iv. සුළු දෙමැදුම්.

07. ''විශ්මය'' නැමැති ස්ථායි භාවයෙන් ජනිත වනුයේ .............................. රසයයි.
   i. අද්භූත ii. බීභත්ස්‍ය iii. හාස්‍යය iv. කරුණා

08. ''විදෙන ලෙළෙන නරුබර පුළුලුකුල රැඳී'' යන කවි පදය අයත් වන්නේ ........................... සංදේශ කාව්‍යයටය.
   i. පරෙවි. ii. කෝකිල. iii. සැවුල්. iv. සැළලිහිණි.

09. ........................ නම් ග්‍රන්ථය රොබට් නොක්ස් විසින් රචිත කෘතියකි.
   i. ඩේවි දුටු පුරාණ ලංකාව. ii. ඩේවි දුටු ලංකාව. iii. ලංකා ඉතිහාසය. iv. එදා හෙළදිව.

10. ප්‍රස්තාකරණයේදී කෙටි අක්ෂර හදුන්වනු ලබන්නේ ......................... නමිනි.
   i. ලඝු අක්ෂර. ii. ප්ලූත අක්ෂර. iii. ගුරු අක්ෂර. iv. ද්‍රැත අක්ෂර.

11. ඉදිරි ඡායාරූපයෙන් දැක්වෙන්නේ,
   i. වඩිග පටුන නර්තනය යි. ii. දෙවොල් නර්තනය යි .
   iii. තෙල්මෙ නර්තනය යි. iv. වාහල නර්තනය යි.



12. වෘත්තීය ජන නැටුමක් වන්නේ,
   i. සවරම්. ii. චාමර. iii. ගොයම්. iv. තාලම්.

13. නර්තන ඉතිහාස තොරතුරු වලට අනුව දේවදාසින් 07ක් සිටි බවත්, ඔවුන්ට මාස් පතා වේතනයක් ලබා දුන් බවත් සඳහන් වන්නේ,
   i. සැස්සේරුව සෙල්ලිපියේ ය. ii. පාලමොට්ටායි සෙල්ලිපියේ ය.
   iii. පෙරියම්කුලම් ගිරි ලිපියේ ය. iv. කොරවක්ගල ලෙන් ලිපියේ ය.

14. පංචතූර්යය භාණ්ඩ වර්ගීකරණයට අනුව විතතාතන භාණ්ඩයක් වන්නේ,
   i. ගැට බෙරය. ii. දවුල. iii. තම්මැට්ටම. iv. තාලම්පොට.

15. නාදය මූලික මාධ්‍ය කොට ගනු ලබන්නේ,,

i. නර්තන කලාව සඳහාය. ii. චිත්‍ර කාලාව සඳහාය. iii. සංගීත කලාව සඳහාය. iv. වාදන කලාව සඳහාය.

16. මහනුවර යුගයේ වන්නම් රචනා කිරීමට සම්බන්ධ වූ පුද්ගලයන් වනුයේ,

i. ගණිතාලංකාර, රම්මොලක අදිකාරම් ය. ii. ගණිතාලංකාර, 11 වන රාජසිංහ රජු ය.

iii. මල්වතු විහාරවාසී හිමි නම, 11 රාජසිංහ රජුය. iv. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු, 11 රාජසිංහ රජුය.

17. ''කමත" හා "තානායම්පොළ" යනුවෙන් හඳුන්වන්නේ,

i. සොකරි හා නාඩගම්වල රංග භූමි. ii. සොකරි හා කෝලම්වල රංග භූමි.

iii. නාඩගම් හා රූකඩවල රංග භූමි. iv. කෝලම් හා සොකරිවල රංග භූමි.

18. රාස්ලීලා, පරන්, තෝඩායම් හා තිල්ලානා යන නර්තන අංග අයත් වන නර්තන සම්ප්‍රදායන් වනුයේ,

i. මණිපුරි, භරත, කතකලි හා කථක් යන නර්තන සම්ප්‍රදායන් ය.

ii. භරත, කථක්, මණිපුරි හා කතකලි යන නර්තන සම්ප්‍රදායන් ය.

iii. මණිපුරි, කථක්, කතකලි හා භරත යන නර්තන සම්ප්‍රදායන් ය.

iv. කතකලි, කථක්, භරත හා මණිපුරි යන නර්තන සම්ප්‍රදායන් ය

19. අන්දර කැලේ - කැන්දර අලේ ... යන කවි පද කොටස අයත් වන්නේ,

i. ග්‍රහ පන්ති කවි වලට ය. ii. කුළු කවි වලට ය. iii. චාමර කවිවලට ය iv. ටීකා සීපද වලට ය.

20. රාමාට්ටම්, ක්‍රිෂ්ණාට්ටම් යන නෘත්‍ය නාටක අයත් වන්නේ,

i. කතකලි නර්තන සම්ප්‍රදායට ය. ii. භරත නාට්‍ය සම්ප්‍රදායට ය.

iii. මණිපුරි නර්තන සම්ප්‍රදායට ය. iv. කථක් නර්තන සම්ප්‍රදායට ය.

21. පහත ඡායාරූපයෙන් දැක්වෙන රගමඩල අයත්වන්නේ,



i. සොකරි නාටකයටයි. ii. කොහොඹා කංකාරියටයි.

iii. මල් මඩුවටයි. iv.කෝලම් නාටකයටයි.

22. අස්නේ, තෙල්මෙ, මුදුන් තාලය යන නර්තන අංග අයත් වන්නේ,

i. උඩරට, සබරගමු, පහතරට නර්තන සම්ප්‍රදායන්ට ය. ii. සබරගමු, උඩරට, පහතරට නර්තන සම්ප්‍රදායන්ට ය.

iii. උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායන්ට ය. iv. පහතරට, උඩරට, සබරගමු නර්තන සම්ප්‍රදායන්ට ය.

23. අංජලිකා චිත්‍රසේන මහත්මිය, චිත්‍රසේන ඩයස් මහතා දායක වූ මුද්‍රා නාට්‍යය වනුයේ,

i. කරදිය හා තිත්තබතයි. ii. චණ්ඩාලිකා හා කුඹී කතාවයි.

iii. කරදිය හා කුඹී කතාවයි. iv. කුඹී කතාව හා කරදිය යි.

24. 1934 ලංකාවට පැමිණි රබීන්ද්‍රනාත්තාගෝර් තුමා ඇතුළු කණ්ඩායම ඉදිරිපත් කළ නෘත්‍ය නාටකය වනුයේ,

i. ශාප්මෝචන් ය. ii. සීතාහරණ ය. iii. රාමාට්ටම් ය . iv. ක්‍රිෂ්ණා ලීලාය.

**ප්‍රශ්න අංක 25 සිට 28 දක්වා නිවැරදි පිළිතුරු පහත වගුව ඇසුරින් තෝරන්න.**

| පේළිය | 1 තීරුව | 2 තීරුව | 3 තීරුව |
|---|---|---|---|
| A | වර්ණ, රේඛා | දිසා හා තල | සම්බන්ධතා |
| B | අංගරචනය | රංගවස්ත්‍රාභරණ | රස හා භාව |
| C | පසුතල නිර්මාණ | අවකාශය | විදුලි ආලෝකය |
| D | තිත් පහන් | ඇඟීමේ කලාව | රටා, හැඩතල |

25. භරතමුණි විසින් රචනා කරන ලද නාට්‍ය ශාස්ත්‍රයේ සඳහන් වන කරුණු ඇතුළත් වනුයේ,

i. A පේළියේ 2 තීරුවේ වේ. ii. B පේළියේ 3 තීරුවේවේ.

iii. C පේළියේ 1 තීරුවේ වේ. iv. D පේළියේ 3 තීරුවේ වේ.

26. චිත්‍ර කලාවේ මූලිකාංග අයත්ව ඇත්තේ,

i. D පේළියේ 1 තීරුවේ ය. . ii. D පේළියේ 2 තීරුවේ ය.

iii. A පේළියේ 1 තීරුවේ ය. iv. C පේළියේ 3 තීරුවේය.

27. ආලෝකකරණයේදී භාවිතා වන ප්‍රධාන පහන් වර්ග වලින් එක් පහන් වර්ගයක් දක්වා ඇත්තේ,

i. D පේළියේ 1 තීරුවේ ය. ii. B පේළියේ 2 තීරුවේ ය.

iii. C පේළියේ 3 තීරුවේ ය. iv. A පේළියේ 3 තීරුවේය.

28. වෙස් මෝස්තර නිර්මාණයේදී සුවිශේෂී වන ප්‍රධාන අංගය අයත් වන්නේ,

i. B පේළියේ 1තීරුවේ ය. ii. B පේළියේ 2 තීරුවේ ය.

iii. A පේළියේ 3 තීරුවේ ය. iv. C පේළියේ 2 තීරුවේ ය.

29. පහත ඡායාරූප වලින් දැක්වෙන්නේ, අනුපිළිවෙලින්

1  2  3 

i. කතකලි, මණිපුරි හා භරත නර්තනාංගයන්ය. ii. මණිපුරි, කථක් හා භරත නර්තනාංගයන්ය.

iii. කතකලී,භරත හා මණිපුරි නර්තනාංගයන්ය. iv. භරත, කතකලී හා මණිපුරි නර්තනාංගයන්ය.

30. සම්මා සම්බුද්ධ ඥාණේන ... මෙය,

i. සිරසපාද ගායන කොටසකි. ii. නමස්කාර ගායන කොටසකි.

iii. අෂ්ටක ගායන කොටසකි. iv. කඩතුරා ගායන කොටසකි.

31. උඩරට නැටුමේ "බඹර සරඹය" ලෙස හඳුන්වන්නේ

i. 8 ගොඩ සරඹය යි. ii. 9 ගොඩ සරඹය යි. iii. 10 ගොඩ සරඹය යි. iv. 11 ගොඩ සරඹය යි.

32. කොහොඹාකංකාරි ශාන්තිකර්මයේ පුද ලබන දෙවිවරු වනුයේ,

i. කොහොඹා දෙවි හා දෙවොල් දෙවියන් ය. ii. කොහොඹා දෙවියන් හා බණ්ඩාර දෙවියන් ය.

iii. මංගර දෙවි හා දොවොල් දෙවියන් ය. iv. වීරමුණ්ඩ දෙවි දොවොල් දෙවියන් ය.

33. දෙතිතේ තාල රූප වලට අයත් වන උඩරට වන්නම් දෙකකි

i. හනුමා හා තුරඟා. ii. සිංහරාජ හා හනුමා. iii. තුරඟා හා සැව්ලා. iv. සැව්ලා හා හනුමා.

34.''බර අත්ගෙන කගින්''..... යන කවියේ ඉතිරි කොටස

i. ඇණකොන්තව් වලින් ... යනුවෙනි ii. ගසමින් කගපතින් ... යනුවෙනි

iii. දෙපළුව අසුරසෙන් ... යනුවෙනි iv. බලයුත් සැවතිඳුන් ... යනුවෙනි

35. මාත්‍රා 2+3 ට නර්තනය කළ හැකි වට්ටම වනුයේ,

i. කුංතකුජිංගත වට්ටම ය. ii. කුඳංත ගතදොං වට්ටම ය.

iii. දොං ජිංත ගතදොංත වට්ටම ය. iv. දොඟර ජිංත වට්ටම ය.

36. අවුල් හැරය, කාගුල් කුට්ටම හා හැඩ කැල්ල පිළිවෙලින් අයත් වන්නේ,

i. පහතරට, උඩරට හා සබරගමු සම්ප්‍රදායන්ට ය. ii. උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායන්ට ය.

iii. උඩරට, සබරගමු හා පහතරට සම්ප්‍රදායන්ටය iv. සබරගමු, පහතරට හා උඩරට සම්ප්‍රදායන්ට ය.

37. ජෙන් තත්තා /// ජෙන්තා යන පද කොටස අයත් වන්නේ,

i. මාත්‍රා 2 + 3 දෙතිතෙහි අයත් සැව්ලා වන්නමේ අඩව්වටය.

ii. මාත්‍රා 2 + 4 දෙතිතෙහි සැව්ලා වන්නමේ අඩව්වටය.

iii. මාත්‍රා 3 + 4 දෙතිතෙහි සැව්ලා වන්නමේ අඩව්වටය.

iv. මාත්‍රා 3 + 4 දෙතිතෙහි සැව්ලා වන්නමේ කස්තිරමටය.

38. "සිංහල නර්තන කලාව" ග්‍රන්ථය රචනා කරන ලද්දේ,

i. තිස්ස කාරියවසම් මහතා යි. ii. ජයසේන කෝට්ටේගොඩ මහතා යි.

iii. මුදියන්සේ දිසානායක මහතා යි. iv. ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය යි.

39. දොදොංත තකු දොං................ මෙය,

i. මාත්‍රා 4 + 4 තාල රූපයට අයත් බෙර පදයකි. ii. මාත්‍රා 3 +4 තාල රූපයට අයත් බෙර පදයකි.

iii. මාත්‍රා 3 + 3 තාල රූපයට අයත් බෙර පදයකි. iv. මාත්‍රා 2 + 4 තාල රූපයට අයත් බෙර පදයකි.

.40. පන්තේරු හා උඩැක්කි නර්තන අංග දක්නට ලැබෙන්නේ,

i. වෙහෙර විහාරවල බුදු ගුණ ගයමින් කරන නර්තනාංගයන් ලෙසයි.

ii. දේවාලවල ස්තෝත්‍ර ගයමින් කරන නර්තනාංගයන් ලෙසයි

iii. ශාන්ති කර්මවල එන නර්තනාංගයන් ලෙසයි.

iv. ගැමි නාටක වල එන නර්තනාංගයන් ලෙසයි.

**කාලය පැය දෙකයි**

# නැටුම් ( දේශීය ) - II

සැලකිය යුතුයි :- ● පළමු ප්‍රශ්නය අනිවාර්‍ය්‍ය වේ
● **පළමුවෙනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
● **සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමිවේ.**

01. **සියලුම ප්‍රශ්නවලට සුදුසු පිළිතුර ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාල ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.**

i. හිසේ සිට දෙපතුල දක්වා රෝග නිරාවරණය සඳහා ............................................................................ කවි ගයනු ලැබේ.

ii. ගැමි නාටකවලදී වැඩි වශයෙන් වෙස් මුහුණු පළඳිනු ලබන්නේ ............................................................ නාටකයේ ය.

iii. වේදිකාව, රංගවස්ත්‍රාභරණ, පසුතල නිර්මාණ ආදිය ................................................................................ අභිනයට අයත් වේ.

iv. කච්චකෙට්ට අභ්‍යාස අයත්වන නර්තන සම්ප්‍රදාය වන්නේ ................................................................. නර්තනයයි.

v. ''රටකට මව් සමගින් ඒ නැව් නැග'' යන කවි පදය ඇතුළත් වන්නේ ...................................................... ගායනයටයි.

vi. 1972 වර්ෂයේදී ......................................................................... විදුහල ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ආරම්භ විය.

vii. භරත නාට්‍යම් දියුණු කිරීම සඳහා ............................................................................................ සහෝදරයන් දායක විය.

viii. ''භරත සතර පෙර ඉසිවර කී ලෙසට'' මෙය කවි පදය අයත් වන්නේ ................................................. සංදේශයටය.

ix. ඇම්බැක්ක දේවාලයේ හා ගඩලාදෙණිය විහාරයේ දක්නට ඇති රූකම් දෙවර්ගයකි.

i. ............................................................ ii. ..................................................................

x. උඩරට හා පහතරට නර්තන සම්ප්‍රදායන්ට අයත් මඩු ශාන්ති කර්ම දෙකකි.

i. ....................................................... ii. ............................................................

02. i. ''දොං දොං ජිං ජිං ගජිගත'' යන බෙර පදය මාත්‍රා 2 + 4 තාල රූපයට ප්‍රස්තාර කරන්න.

ii. ''අතකට ගෙන රබන් පොඩිය ගසති දිසි රුවින්'' මෙම කවිය මාත්‍රා 3 + 3 තාල රූපයට ප්‍රස්තාර කරන්න.

iii. සිංහරාජ වන්නමට අයත් අඩව්ව ප්‍රස්තාරගත කරන්න.

03. පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

i. නවනළු රසය ii. සරල අංග රචනය iii. ගැමි නැටුම්

iv. රස භාව v. මුද්‍රා නාට්‍ය

04. ශාන්ති කර්ම වූ කලී දේශීය නර්තන කලාවේ සංස්කෘතිකාංගයන්ය.

i. කොහොඹා කංකාරියේ නාට්‍යමය අවස්ථා 02ක් නම් කර, විස්තර කරන්න.

ii. දෙවොල් මඩු ශාන්ති කර්මයේ නර්තනාංග දෙකක් නම් කර, එක් නර්තනාංගයක් විස්තර කරන්න.

iii. පහන් මඩු ශාන්ති කර්මයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය නම්කර, රූප සටහනක් මගින් හඳුන්වන්න.

05. පහත රූපරාමුව ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



i. මෙම රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය හඳුන්වන්න.

ii. එය ප්‍රචලිත ප්‍රදේශ නම්කර දායක වූ රජවරුවන් පිළිබඳ විස්තර කරන්න.

iii. මෙම නර්තන සම්ප්‍රදායට භාවිතා වන රංගවස්ත්‍රාභරණ ලියා දක්වන්න.

06. i. චිත්‍ර කලාවෙන් නර්තන කලාවට ලැබෙන පිටිවහල උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

ii. "සංගීත ප්‍රසංගවලදී නර්තනයට හිමි තැන" මැයෙන් ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න.

iii. මුද්‍රා නාට්‍ය කලාවට නර්තනය යොදා ගෙන ඇති ආකාරය කරදිය මුද්‍රා නාට්‍ය ඇසුරෙන් විමසන්න.

07. i. සිසුන්ගේ මානසික ස්වස්ථතාවයට හේතුවන සාධක 02ක් ලියා දක්වන්න.

ii. නර්තන විෂයය තුළ ඇති ක්‍රියාකාරකම් තුළින් වර්ධනය වන හැකියා පිළිබඳ විස්තර කරන්න.

iii. නර්තන හදාරණ සිසුවෙකු නර්තන කාමරය තුළ දී ගොඩ නගාගෙන ඇති සාරධර්ම පිළිබද විස්තර කරන්න

## අ. පො.ස. (සා/ පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2019

## නැටුම් ( දේශීය )

11 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය - I

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | ii | 11 | ii | 21 | iv | 31 | iii |
| 02 | iii | 12 | iii | 22 | iii | 32 | ii |
| 03 | i | 13 | ii | 23 | iv | 33 | iii |
| 04 | iv | 14 | ii | 24 | i | 34 | i |
| 05 | i | 15 | iii | 25 | ii | 35 | iii |
| 06 | ii | 16 | i | 26 | iii | 36 | ii |
| 07 | i | 17 | ii | 27 | i | 37 | ii |
| 08 | iv | 18 | iii | 28 | ii | 38 | iii |
| 09 | iv | 19 | iv | 29 | iii | 39 | i |
| 10 | i | 20 | i | 30 | ii | 40 | i |

( ලකුණු 40 )

## පිළිතුරු පත්‍රය - II

1. i. සිරසපාද
   ii. කෝලම්
   iii. ආහාර්ය
   iv. කතකලි
   v. රබන්
   vi. ගිරාගම ගුරු
   vii. තාන්ජාවුර්
   viii. සැවුල්
   ix. 01. ලී කැටයම් 02. ගල් කැටයම්
   x. 01. කොහොඹා කංකාරිය 02. දොවොල් මඩුව

ල. 12කි

අංක 02 සිට 07 දක්වා දී ඇති ප්‍රශ්න සඳහා අනු කොටසකට ලකුණු 4 බැගින් ලකුණු 12කි.

( මුළු ලකුණු 12 x 5 = 60 )

| | |
|---|---|
| I පත්‍රය සඳහා ලකුණු | 40 |
| II පත්‍රය සඳහා ලකුණු | 60 |
| මුළු ලකුණු | 100 |